**ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,

චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**මූලධන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කරගැනීම සඳහා රු.5,743,484 ක් වැයකර තිබුණ ද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීම් ලෙස රු.4,842,327 ක් ඇතුළත් කර තිබුණි. ඒ අනුව රු.901,157 ක වෙනසක් නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු. 5,743,484 ක් වැයකර තිබුණද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීම් ලෙස ඇතුලත් කර ඇත්තේ රු. 4,842,327.33 ක වත්කම් පමණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් මිලදී ගනු ලබන වත්කම් සිගාස් ගිණුම වෙත මිලදී ගැනීමක් ලෙස ඇතුලත් කිරීමට ක්‍රමවේදයක් නොතිබීම හා මිලදී ගැනීම් කිහිපයක් 4ජ'නල් ගතකිරීමේදී අතපසුවී තිබීමද, වායුසමීකරණයක් 2019 වසරේ ඉන්වෙන්ට්‍රිගත කිරීම නිසා එය ආරම්භක ශේෂයට ගෙන ඇති බැවින්ද මෙම වෙනස ඇතිවී තිබුණි. | වැය ලෙජරයන් හා මූල්‍ය ප්‍රකාශයේ අගයන් එකිනෙක ගැලෙපන පරිදි නිවැරදි අගය භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් සඳහා මුදල් වැය කිරීම් තුළ මූලධන වත්කම් පුනරුත්ථාපනයට සහ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා දැරූ රු.18,550,399 ක වියදම් ද ඇතුළත් කර | මූලධන වත්කම් පුනරුත්ථාපනයට හා කාර්ය මණ්ඩල පුහුණුව සඳහා දරන ලද වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල පෙන්නුම් කිරීමට අයිතමයක් නොමැති බැවින් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා කාර්ය මණ්ඩල පුහුණුව, භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීමක් ලෙස සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර ඇත. එබැවින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි අගයන් ඇතුලත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබූ බැවින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සහ මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය පිළිවෙලින් එම වටිනාකමින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය පිළිවෙලින් රු.18,550,399 ක් අඩුවෙන් හා වැඩියෙන් පෙන්නුම් කරයි. | |
| (ඇ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අතර වර්ෂය තුළ ලැබීම්, ගෙවීම් හා හර ශේෂ සීමාව අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර ඒ පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. | වෙනත් ආයතනයක් මගින් අප වෙත පවරනු ලබන ණය ශේෂයන් අපගේ මාසික ගිණුම් සාරාංශයන්හි සටහන් නොවන නමුත් අපගේ ණය ගැති හා ණය හිමි ලේඛනයෙහි එය සටහන්ව ඇත. විගණන විමසුමෙහි වර්ෂය තුළ හර කිරීම්වල වෙනස ලෙස සටහන්ව ඇත්තේ එම රු.2,038,544.00 ක මුදලයි.<br><br>ශේෂ පිරික්සුමෙහි සටහන්ව ඇති අප ආයතනය වෙත බැර කරන ලද ණය ශේෂයන්හි මෙන්ම වෙනත් ආයතන වෙත බැර කරන ලද ණය ශේෂයන්හි එකතුව වන රු. 12,253,618.00ක මුදල විගණන විමසුමෙහි දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුළ බැර කිරීම් ලෙස සටහන් කර ඇත.<br><br>උපරිම හර ශේෂ සීමාවෙහි වෙනස ලෙස විගණන විමසුමෙහි සටහන් කර ඇත්තේ ඉහත වර්ෂය තුළ හර කිරීම් සහ වර්ෂය තුළ බැර කිරීම්වල වෙනස්කම්වල එකතුවයි. | වෙනස්කම් සැසඳුම් ප්‍රකාශයේ නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 2 ක් සඳහා පරිපූරකයක් මගින් ප්‍රතිපාදන රු.2,149,160ක් මාරු කරගෙන තිබුණු අතර නැවත එම වැය විෂයයන්ගෙන් වෙනත් පුනරාවර්තන වැය විෂයයන් වලට රු.6,385,000ක් මු.රෙ.66 මගින් මාරුකර තිබුණි | දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂයේ වියදම් අනුව වැය විෂයන්වල ඉතිරි වීම් පැවති බැවින් මු:රෙ 66 මගින් රු.6,385,000.00 ක් මාරු කර ඇත.<br>ආරක්ෂක අමාත්‍යාංශය විසින් කළ ඉල්ලීමක් අනුව මහා භාණ්ඩාගාරය විසින් රු.2,149,160.00 ක ප්‍රතිපාදන ලබා දුන් බැවින් එම ප්‍රමාණය ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්ට බැර කර අප දෙපාර්තමේන්තු වැය ශීර්ෂවලට හර කරන ලදී. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | මූලධන වැය විෂයයන් 04ක හා පුනරාවර්තන වැය විෂයයන් 09ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 43 සිට සියයට 209 දක්වා මු.රෙ.66 මාරු කිරීම් මගින් ප්‍රතිපාදන මාරුකරගෙන තිබීම හේතුවෙන් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතාවයක් නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සකස් කරනුයේ 2019 ජුනි මසදී ඒ වන විට පැවති තත්වය සැලකිල්ලට ගනිමිනි. නමුත් 2020 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු 4කින් ලබාදුන් අතර ඇතැම් වැය ශීර්ෂවලට ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩුවෙන් ප්‍රතිපාදන ලැබී | මු.රෙ 50 පරිදි නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| | තිබුණි. තවද ඒ වන විට රටතුළ පැවති වාතාවරණය අනුවද ඇස්තමේන්තු කළ ප්‍රමාණයන්ට වඩා වෙනස් වීම් සිදුවී ඇත. | |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව බැරකම් හා බැදීම්වලට එළඹීමේදී කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ඇති ප්‍රතිපාදන නොඉක්මවිය යුතු නමුත් වැය විෂයන් 08 ක එකතුව රු.2,308,508 කින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. | 2020 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු 4ක් යටතේ ලබාදුන් අතර ඇතැම් වැය ශීර්ෂවලට ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩුවෙන් ප්‍රතිපාදන ලැබී තිබුණි. තවද ඒ වන විට රටතුළ පැවති වාතාවරණය අනුව කටයුතු කිරීමට සිදුවූ බැවින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදුවිය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ප්‍රමාණය එම වර්ෂයේ ප්‍රතිපාදනය නොඉක්මම විය යුතු වීම. |
| **(ආ)** | 2021 වර්ෂය තුළ නිරවුල් කළ රු. 332,931 ක් වටිනා බැදීම් හා බැරකම් 05 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැදීම් හා බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණි. | 2021 වර්ෂය තුළ නිරවුල් කළ බැරකම් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් නොවීම.<br>නිරීක්ෂණය නිවැරදිය. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ඇතුලත් කළ යුතුය. |

## 2.3 ගණන් දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූලා පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව තුල දැනට ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රම හි පවතින අඩුපාඩු හා දුර්වලතා පිළිබඳ ව අවස්ථානුකූලව අංශ ප්‍රධානී රැස්වීම් වල දී හා විගණන කළමණාකරණ රැස්වීම් වලදී සාකච්ජා කර ඇති අතර එම අවස්ථාවලදී නිරීක්ෂණය වූ අඩුපාඩු හා දුර්වලතා සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | 2015 මැයි 15 දිනැති මු.අ.01/2015/ 01 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 03 (අ) ඡේදය | 201,234 | විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් එතෙරදී දරනු ලබන ගමන් වියදම්, ගුවන් තොටුපල ගාස්තු, දුරකථන වියදම් වැනි අනියම් වියදම් පියවා ගැනීම සඳහා අනියම් | මෙම නිලධාරිනිය සහභාගී වූ ඉන්දියාවේ පැවති පුහුණු පාඨමාලාව පිළිබඳ ඉදිරිපත් කර ඇති ලිපියේ දක්වා ඇත්තේ ඉන්දියාවට යාමට සහ ආපසු ඒමට ගුවන් ටිකට්පත් සඳහා ගාස්තු, පාඨමාලා ගාස්තු, | දීමනා ගෙවීමේදී අදාළ චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ගෙවිය |

| | | | | |
|---|---|---|---|---|
| | | දීමනා ලෙස කිසියම් මුදලක් නොගෙවන විටකදී පමණක් දිනකට ඇමරිකන් ඩොලර් 40 බැගින් උපරිම දින 30 ක් සඳහා අනියම් දීමනා ගෙවිය හැකි වුවද ඉන්දියාවේ පැවැත්වූ පුහුණු පාඨමාලාවක් සඳහා ඉන්දීය රජය විසින් දිනකට ඉන්දීය රුපියල් 1500 (ඇමරිකන් ඩොලර් 21) බැගින් ගෙවීමක් හා අදාළ අනෙකුත් සියලුම පහසුකම් සපයන අවස්ථාවකදී එම පාඨමාලාවට සහභාගිවූ නිලධාරිනිය වෙත දෙපාර්තමේන්තුව මගින් චක්‍රලේඛයට පටහැනි ආකාරයෙන් අනියම් දීමනාව ගෙවා තිබුණි. | නවාතැන් පහසුකම්, ආහාරපාන, පාඨමාලාවේ කොටසක් වශයෙන් සිදුවන ගමනාගමන වියදම් හා ගුවන් තොටුපල දක්වා යාම් - ඒම් සඳහා ඉන්දියන් රුපියල් 1500 ක් ගෙවන බවයි. මේ වියදම් සඳහා පාඨමාලා අවශ්‍යතාවයන්ගෙන් බැහැරව ඉන්දියාව තුළ ගමන් වියදම්,ගුවන් තොටුපල ගාස්තු, දුරකථන ගාස්තු වැනි අනියම් වියදම් දරා ගැනීම සඳහා මුදලක් ඇතුලත්ව නොතිබූ බැවින් 2015 මැයි 15 දිනැති මු. අ.01/2015/01 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 03 (අ) ඡේදය ප්‍රකාරව නිලධාරිනියට අනියම් දීමනාව ගෙවන ලදී. | යුතුය. |
| (ii) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතින අතර දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සීමාකර ඇති කාල වකවානුවක් බැවින් භාණ්ඩ අපහරණ කටයුතු සිදුකර ගැනීමට අපහසු වී ඇත. එම කටයුතු ඉටුකර | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගැනීමට හැකිවූ වහාම භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන බව දන්වමි. | |
| (iii) | අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (3) ඡේදය | ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කළයුතු යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. | අතපසු වීමකින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වී නැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

--------------------------------------

| **නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශයේ අංක 03/2015 හා 2015 ජූලි 14 දිනැති චක්‍රලේඛය සහ අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛවල සඳහන් උපදෙස් පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගන්නා නිලධාරීන් විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අග්‍රිම පියවිය යුතු වුවත් නිලධාරීන් තිදෙනෙකු අවස්ථා 04 කදී ලබාගන්නා ලද රු.362,000ක් සම්බන්ධයෙන් දින 33 සිට දින 125ක් දක්වා ප්‍රමාද වී පියවීම් සිදුකර තිබුණි. | මෙම වකවානුව තුල රටතුල ඇඳිරිනීතිය ක්‍රියාත්මක විම , රාජ්‍ය ආයතනවල සීමිත නිළධාරීන් පිරිසක් සේවයට වාර්තා කිරිම හා ක්‍රමානූකූලව ගනුදෙනු කිරිමට හැකියාවක් නොමැති විම යන හේතුන් මත මෙම අත්තිකාරම් පියවීම ප්‍රමාද විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.6 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු. 7,488,595 ක් වූ කල් ඉකුත් තැන්පතු 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට හෝ කොන්ත්‍රාත් තැන්පතු සම්බන්ධයෙන් වූ විට කොන්ත්‍රාත්තු වලින් වූ අලාභ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | නව මාධ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු වලට අදාල රඳවා ගත් මුදල රු.7,488,595කි. මෙම රඳවුම් මුදල නිදහස් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වාර්ෂික අයවැය ලේඛනය අනුව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම්කර තිබූ රු. මිලියන 10.5ක කාර්යයන් 34ක් 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව අනුව ඉටු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ රටතුල පැතිර ගිය කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ නිරෝධායන ඇඳිරි නීතිය සහ සංචරණ සීමා පැනවීම හේතුවෙන්සීමා සහිත කාර්ය මණ්ඩලයක් පමණක් බොහෝ අවස්ථාවල දී කාර්යාලය වෙත කැඳවීමට සිදුව තිබූ බැවින් සහ අත්‍යාවශ්‍ය මාධ්‍ය ආවරණ සඳහා එලෙස සේවයේ නිරත වූ සීමිත කාර්ය මණ්ඩලය යෙදවීමට සිදු වූ බැවින් ද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ බොහෝ කාර්යයන් එපරිදිම ඉටුකිරීමට නොහැකි විය | සැලසුම් කරන ලද කාර්යයන් අප්‍රමාදව ඉටුකරගැනීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වාර්ෂික අයවැය ලේඛනය අනුව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම්කර තිබූ කාර්යයන් 12ක ප්‍රගතිය සියයට 4 සිට සියයට 100ක් වූ අතර කාර්යයන් 17ක ප්‍රගතිය සඳහන්ව නොතිබුණු බව 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව අනුව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ රටතුල පැතිර ගිය කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ නිරෝධායන ඇඳිරි නීතිය සහ සංචරණ සීමා පැනවීම සමඟ කාර්ය මණ්ඩලය සීමා සහිතව කාර්යාලය වෙත කැඳවීමට සිදුව තිබූ හෙයින් සහ අත්‍යාවශ්‍ය මාධ්‍ය ආවරණ සඳහා සේවයේ නිරත වූ සීමිත කාර්ය මණ්ඩලය යෙදවීමට සිදු වූ නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් කිහිපයක අපේක්ෂිත මට්ටමේ නිමැවුමක් ලබා ගැනීමට නොහැකි විය. | අපේක්ෂිත නිමවුම් මට්ටම ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජනමාධ්‍ය අමාත්‍යාංශයේ භාවිතය සඳහා යොදාගෙන තිබූ අංක PD 9625 දරන ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත් රථය 2016 දෙසැම්බර් 26 දින අනතුරකට ලක්වී තිබුණි. එම අනතුර සිදුවන අවස්ථාවේ රියදුරු බලපත්‍රයක් නොමැති පුද්ගලයෙකු රථය ධාවනය කර තිබුණි. එම අනතුරින් පසු රථය අලුත්වැඩියා කිරීම සඳහා රු.453,000 ක් දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය තුළදී වැයකර තිබුණු අතර, රක්ෂණයෙන් කිසිදු වන්දි මුදලක් ලැබී | PD9625 යන අංක දරණ කැබ් රථය අනතුරට ලක්වීමෙන් පසුව දීර්ඝ කාලයක් දෙපාර්තමේන්තු රථගාලේ ගාල් කර තිබුණු අතර අව්වැසි ආදියෙන් හානි වී රථය තවදුරටත් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වීමෙන් වලක්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ වියදමෙන් මිලගණන් කැඳවා අළුත්වැඩියාව සිදු කරන ලදි. මෙම අනතුර සම්බන්ධයෙන් ජනමාධ්‍ය | රාජ්‍ය සම්පත් විධිමත් පරිදි භාවිතා කිරීම සඳහා ඒවාට සිදුවන හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කළ යුතුය |

| | |
|---|---|
| නොතිබුණි. එම හානිය සම්බන්ධව මූල්‍යා ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. 2016 දෙසැම්බර් 26 දින සිදුවූ අනතුර වෙනුවෙන් 2020 සැප්තැම්බර් 04 දින මුදල් රෙගුලාසි 104(3) යටතේ ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කර තිබුණු අතර රු.453,000ක් රථය ධාවනය කළ පුද්ගලයාගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුනද වාර්තාවේ දින දක්වා එම අයකර ගැනීම් සිදුකර නොතිබුණි. | අමාත්‍යාංශය මඟින් මු.රෙ. 104 යටතේ පරීක්ෂණ කටයුතු අවසන් කර තිබෙන බවද, අදාළ අලාභය අයකර ගැනීම සඳහා වගකිවයුත්තන්ට එරෙහිව නීතිමය කටයුතු ආරම්භ කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීම සඳහා කටයුතු කර ඇති බවද, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දී ඇත. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | ----------- |
| (අ) | අධ්‍යක්ෂ (රජයේ චිත්‍රපට අංශය) තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා විධායක ගණයේ නිෂ්පාදක (දෙපාර්තමේන්තුගත) ලෙස කටයුතු කරන නිලධාරියා අවස්ථා 03 කදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි පත්කර තිබුණි. මෙම තනතුර සඳහා 2019 ජූලි 01 දින සිට වසරක කාලයක් සඳහා පත්කිරීම සිදුකරන අවස්ථාවේදී කොන්ත්‍රාත් තනතුරට අදාළ පුරප්පාඩුව නොපමාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උපදෙස් ලබාදී තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් මෙම තනතුර සඳහා ඉහත නිලධාරියා දිගින් දිගටම රාජකාරී ඉටුකිරීමේ පදනමින් පත්කර තිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මග පෙන්වීම් අනුව ඉදිරි කාලයේ දී අයදුම් පත් කැඳවා සුදුසු නිලධාරියකු බඳවා ගැනීමට පියවර ගනු ලබන බව සඳහන් කරමි. | තනතුරු පුරප්පාඩු පියවීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවියයුතු රු.211,486 ක්වූ වසර 19 කට වඩා පැරණි ශේෂයක් පැවති අතර 2021 පෙබරවාරි 28 දින වනවිටත් එම ශේෂයන් අයකරගෙන නොතිබුණි. | නිලධාරීන් දෙදෙනෙකුගේ ආපදා ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ඉල්ලා ඇති අතර, මේ වන තෙක් අදාළ උපදෙස් ලැබී නැත. අනෙක් නිලධාරිනිය තමන් සේවයෙන් හැර ගියා සේ සැලකීම පිළිබඳව අභියාචනයක් ඉතිරිපත් කර තිබෙන අතර එයින් ලැබෙන තීරණ මත ඇයගෙන් අයවිය යුතු මුදලද අය කරගැනීමට කටයුතු කරමි. | අයවියයුතු ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 19 දින මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 159,870 ක ණය ශේෂය 2021 පෙබරවාරි 28 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 19 දින මියගිය බී. එස්. ඩී. ප්‍රේමසුන්දර මහතාගෙන් අයවිය යුතු රු. 159,870/= ක ණය ශේෂය ඔහුගේ යැපෙන්නන් වෙතින් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | අයවියයුතු ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

**4.** **තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

**-------------------------------------------------**

| නිරීක්ෂණය<br>---------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්කයක් ලෙස ජනමාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් පරිගණකගත ක්‍රමවේදයකට ලබාදීම හඳුනාගෙන තිබුණු අතර එහි ප්‍රගතිය සියයට සියයක් ලෙස දක්වා තිබුණ ද, තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය යටතේ එම ක්‍රියාවලිය පරිගණකගත කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංගය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා එක්ව නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම 2021 වසරේ සිට ආරම්භ කිරීමට හැකි වීම ලෙස දක්වා තිබීම නිසා එම කරුණු අතර පරස්පරතාවයක් නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ දී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත අදාළ මෘදුකාංගය භාවිතයෙන් ජනමාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳ ව ප්‍රමාණවත් පුහුණුවක් අදාළ කාර්ය මණ්ඩයලට ලබාදීමට නොහැකි විය. එම පුහුණු කිරීම සඳහා 2021 වර්ෂයේ මුල් මාස කිහිපයක් ගත විය. මේ වනවිට එම පුහුණුවීම් ලබා දීමෙන් පසුව එහි කටයුතු ක්‍රියාවට නැගෙමින් පවතී. | වාර්තාවල නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය<br>-------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී අනුමත සේවක සංඛ්‍යාව 343 ක් වී තිබුණු අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 237 ක් වීම නිසා පුරප්පාඩු 106 ක් පවතින අතර මෙම පුරප්පාඩු පිරවීම සඳහා මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාකර නොතිබුණි. | අදාළ පුරප්පාඩු අතරින්, ඒකාබද්ධ සේවාවන්ට අදාළ පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.<br>එසේම, දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සඳහා අදාළ කාර්යයන් සිදු වෙමින් පවතී. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවක් සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු වුවද රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු 2021 අප්‍රේල් වනවිටත් පත්කර නොතිබුණි | දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙක් පත්කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. එසේම, එම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙක් පත්කරන තෙක්, වැඩබලන පදනමින් හෝ නිලධාරියෙක් පත් කරන ලෙස ජනමාධ්‍ය අමාත්‍යාංශය දැනුවත් කර තිබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |